# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,099 — 1960 අප්‍රේල් 1 වැනි සිකුරාද — 1.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## III වැනි කොටස – ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 165 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 166 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මඩකලපු දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුවේ ඒරාවූර් 3 වැනි කොට්ඨාශ ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 2, පර්චස් 16 ඇති ඉඩමය. ඊට මායිම් :—

උතුරට : පටු මාවත; නැගෙනහිරට : ඒරාවූර් සිට පුන්නකුඩාවට යන පාර; දකුණට : ඒරාවූර් පොලිස් ස්ටේෂන් ඉඩම; බස්නාහිරට : බිටි/ඒරාවූර් ආණ්ඩුවේ ශ්‍රේෂ්ඨ පාඨශාලාව ඉඩම.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා,

අමාත්‍යාංශයේ අංක ජේ. 58/59 ඊ. 172.

1960 ජනවාරි මස 18 වැනි දින,
කොළඹදීය.

### 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ආදායම් කොට්ඨාශයේ ගඟපළාත කෝරළේ හෙන්දෙනිය ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 19, රූඩ් 1, පර්චස් 4ක් වූ නියඳගල වත්ත නැමති ඉඩම. මූලික සිතියම් අංක ඒ 2,673හි කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කරන ලද කෝට්ටේ තලවතුගොඩ පදිංචි රාජ නීතිඥ ඇන්. ඊ. වීරසූරිය මහතා, පේරාදෙනියේ මීවතුරේ පදිංචි ඒ. එච්. ඇම්. පුංචි මහත්මයා, පේරාදෙනියේ හෙන්දෙනියේ අංක 374හි පදිංචි අයි. ඇම්. ටී. අබ්දුල් හමීඩ් යන අය අයිතිවාසිකම් කියන ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් තියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 මැයි මස 4 වැනි දින පූ.භා. 10ට මහනුවර කච්චේරියේදී මා හමුවිය යුතුයි.

165—ජේ. ඇන්. බී 22637—1075 (3/60)

තවද, 1960 අප්‍රේල් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකරගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

මගේ අංක : ඇල්. ඩී. සී. 27.

1960 මාර්තු මස 23 වැනි දින,
මහනුවර කච්චේරිය.

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. ඇස්. 4458.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ බෙල්වුඩ් වත්තේ පිහිටි ඒ. 2,439 දරණ මූලික පිඹුරයේ 3 වැනි බිම් කැබැල්ලෙන් අක්කර 1/4ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් හා එහි පිහිටා ඇති ගොඩනැගිල්ලත් පෝෂකර්ම මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා උඩදෙල්තොට ශ්‍රී ධර්මදාන කාන්තා සමිතියේ භාරකරුවන් වන කේ. ඇම්. කරුණාරත්න, ආර්. ඇම්. මුතුමැණිකේ හා ඩී. ඇල්. ඒ. ලසිසා හාමිනේ යන තෝනා මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 13යි ;

(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 1ක් ඇතුළතදී මහනුවර දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි පෝෂකර්ම මධ්‍යස්ථානයක් තනා නිමකළ යුතුය ;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පෝෂකර්ම මධ්‍යස්ථානයක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්. ඇස්. 4558.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ මාන්කුලම්හි පිහිටි අක්කර 1/4ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ශාලාවක් ඉදිකිරීම සඳහා මාන්කුලම් ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන නාගමුතු රතිනම්, මුරුගේසු මාරිමුතු සහ කිරිබණ්ඩා සේමම්පිල්ලේ යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේ ය :—

උතුරට : පෞද්ගලික ඉඩම ; දකුණට : යාපනය-නුවර ප්‍රසිද්ධ පාර ; නැගෙනහිරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලයින් කාමර ; බටහිරට : මාන්කුලම් මුලතිව් පාර.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 5යි ;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 1ක් ඇතුළතදී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ශාලාවක් තනා නිම කළ යුතුය.

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්. ඇස්. 4554.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ කරපුකුට්ටිහි පිහිටි අක්කර 1/2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, ශාලාවක් ඉදිකිරීම සඳහා කරපුකුට්ටි ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන කදිරාමු පෙරියතම්බි, කාසිපිල්ලේ තල්ලයියා සහ පිල්ලියන් සෙල්ලයියා යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේ ය :—

උතුරට : රජයේ ඉඩම ; දකුණට : රජයේ ඉඩම ; නැගෙනහිරට : රජයේ ඉඩම ; බටහිරට : ගම්සභා පටුමග.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5යි ;

(ආ) බද්ද : අවුරුද්දකට රු. 2, ශත 50යි ;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2ක් ඇතුළතදී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ශාලාවක් තනා නිම කළ යුතුය ;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අප්‍රේල් මස 1 වැනි දින,
කොළඹදීය.

---

# විශෙෂ නිවේදනයයි

1960 අප්‍රේල් 13 වැනි බදාදා සහ අප්‍රේල් 15 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 අප්‍රේල් මාසයේ තුන්වැනි සුමානයේ ගැසට් පත්‍රය, 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 අප්‍රේල් 8 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින** සිට අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට **ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී තැන** විසින් කලින් භාරගනු ලැබේ.

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. **පරණ ගැසට් කොපි** තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.